(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(11).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජූනි 07 සිකුරාදා**

---

**2024 ජූනි 18 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 001 — වැඩසටහන 02 — † 2024 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන අටදහස් හත්සිය පනහක් (රු. 8,750,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **001** | - | අතිගරු ජනාධිපති | |
| වැඩසටහන | **02** | - | සංවර්ධන වැඩසටහන• | |
| | | | මූලධන වියදම් | රු. 8,750,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 8,750,000,000** |

• වැය ශීර්ෂ 001හි, වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහනෙහි, ව්‍යාපෘති අංක 06 - "ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මඟපෙන්වීම සහ සම්බන්ධීකරණය" ව්‍යාපෘතිය යටතේ වන අංක 024, 025, 026, 027, 028 සහ 032 උප ව්‍යාපෘතීන්හි උපයෝජනය නොවේයැයි අපේක්ෂිත ප්‍රතිපාදන, අංක 003 උප ව්‍යාපෘතිය වෙත මාරු කිරීමෙන්, මෙම රුපියල් මිලියන අටදහස් හත්සිය පනහක (රු.8,750,000,000) ප්‍රතිපාදන සලසනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2024 ජූනි 07 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව (2021),— 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 154(6) වගන්තිය යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසර, ස්වභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.02.08 / 2024.02.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.03.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.01.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ (2021),— 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 12(5) වගන්තිය යටතේ 2023.10.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ටවර් හෝල් රඟහල පදනමෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.01.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.01.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 ජූනි 20 බ්‍රහස්පතින්දා)**

2141/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂය සඳහා ජනාධිපති ලේකම් කාර්යාල වැය ශීර්ෂය යටතේ විමධ්‍යගත අයවැය වැඩසටහන සහ ඒ හා සමාන වෙනත් වැඩසටහන් යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත සඳහන් විමධ්‍යගත අයවැය වැඩසටහන සහ ඒ හා සමාන වෙනත් වැඩසටහන් යටතේ ව්‍යාපෘති යෝජනා ලබා දී ඇති එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නම, ලබා දී ඇති ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව, එම එක් එක් යෝජනාව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ග්‍රාම නිලධාරි වසම සහ එම එක් එක් ව්‍යාපෘති යෝජනාව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත වැඩසටහන් යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කිරීමේදී අනුගමනය කරන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජූලි 09 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1909/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්මලාන ඩිපෝව මඟින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබූ ගල්කිස්ස ප්‍රධාන බස් නැවතුම්පළ, එම ස්ථානයෙන් ඉවත් කිරීමට බලපාන ලද හේතු කවරේද;

(ii) එම ප්‍රධාන බස් නැවතුම්පළ ස්ථාපිත කිරීම සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩමේ මුල් අයිතිකරුගේ නම සහ ඉඩමේ පිඹුරුපත් අංකය කවරේද;

(iii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iv) එම ප්‍රධාන බස් නැවතුම්පළ ස්ථාපිත කිරීම සඳහා භාවිතා කර තිබූ ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(v) ප්‍රධාන බස් නැවතුම්පළ ස්ථාපිත කිරීම සඳහා එම ඉඩම අත්පත් කර ගන්නා ලද වර්ෂය කවරේද;

(vi) මේ වනවිට ඉහත ඉඩම අයත් ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1913/2024

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති රජයේ ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ඔසුසල පිහිටුවා ඇති ස්ථානයේ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කොළඹ දිස්ත්‍රික්කය තුළ රජයේ ඔසුසල් ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1917/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2020 සිට මේ දක්වා කම්කරු ආරවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට නිරවුල් කර ඇති සහ නිරවුල් කර නොමැති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1942/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය, ශ්‍රී ලංකාවට අවශ්‍ය වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩිම පළාත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම කිරි නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශය කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1969/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) රේගු දෙපාර්තමේන්තුවේ සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රේගු දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරින්ට හා කණිෂ්ඨ නිලධාරින්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුරට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයේ විධායක නිලධාරින්ට හා කණිෂ්ඨ නිලධාරින්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුරට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1995/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැඩි නියඟය හේතුවෙන් හම්බන්තොට, උඩවලව කලාපය, කිරම ඔය කලාපය සහ මලලආර කලාපය ඇතුළු ගිනිකොණදිග තැනිතලාවේ කලාප ගණනාවක වගා බිම් විනාශ වී ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා 'සුරකිමු රුහුණ' සංවිධානය විසින් යෝජනා කර ඇති, පැරණි වාරි සංරක්ෂණ පද්ධතිය විධිමත් කිරීම සහ තෙත් කලාපයේ අතිරික්ත ජලය ඉහත කලාපවලට යොමු කිරීම (කළු ගඟ හැරවීමේ ව්‍යාපෘතිය) යන විසඳුම් දෙක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඉහත සඳහන් කලාපවල පවතින ජල හිඟය මඟහැරවීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කඩිනම් පියවර කවරේද;

(iv) මේ වනවිට නවතා දමා ඇති ගිං ගඟ, සහ නිල්වලා ගඟ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2008/2024

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තේ වගා කරනු ලබන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණයෙන් රජය සහ පෞද්ගලික අංශය සතු භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) තේ නිෂ්පාදනය තුළින් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

(iv) මේ වනවිට කාබනික පොහොර යොදා ගනිමින් තේ වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) කාබනික පොහොර භාවිතයෙන් ලබා ගනු ලබන වාර්ෂික තේ අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තේ අපනයන කරනු ලබන රටවල් කවරේද;

(ii) වාර්ෂිකව අපනයනය කරනු ලබන තේ ප්‍රමාණය කොපමණද;

(iii) එම අපනයනයෙන් උපයනු ලබන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ තේ සඳහා ලෝක තේ වෙළඳපොළේ හිමි වී ඇති ස්ථානය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2024/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ අවුල් සහගත තත්ත්වයන් නිර්මාණය කළ හැකි පුවත් පළ කරනු ලබන ව්‍යාජ මාධ්‍ය ගණනාවක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම මාධ්‍ය කවරේද;

(iii) ලියාපදිංචි කර නොමැති ව්‍යාජ වෙබ් අඩවි තහනම් කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු රජයේ සේවකයන්ට මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කිරීමට මාස දහයකට අධික කාලයක් ගතවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන් ඇතැම් රජයේ සේවකයන් සිය ප්‍රථම විශ්‍රාම වැටුප ලැබීමට පෙර මිය යන අවස්ථා ඇති බවත්;

(iii) එම ප්‍රමාදය රජයේ සේවකයන්ට කරනු ලබන දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රමාදයට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2055/2024

ගරු වේලු කුමාර් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුනෙස්කෝ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) ශ්‍රී ලංකාවට ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන රාශියක් එම නගරයේ පිහිටා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පූජනීය ස්ථාන සහ ගොඩනැගිලි කවරේද;

(ii) ඒවා ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ලබා දෙනු ලබන වාර්ෂික මූල්‍යාධාරය කොපමණද;

(iv) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පෞද්ගලික ගොඩනැගිලි කවරේද;

(v) එම ගොඩනැගිලි හිමිකරුවන්ටද කිසියම් මූල්‍යාධාරයක් ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එම මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)(i)හි සඳහන් ස්ථාන ඒ අයුරින්ම පවත්වාගෙන යන්නේද;

(ii) ඒවායේ වෙනස්කම් සිදු කිරීමට අවසර ලබා දී තිබේද;

(iii) මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජූලි 10 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිරෝද රථ සේවාව තුළින් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරනු ලැබුවද, එම සේවාව නියාමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්;

(ii) ත්‍රිරෝද රථ රියදුරන් විසින් අක්‍රමවත් පරිදි මුදල් අයකිරීම හේතුවෙන් මගීන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ත්‍රිරෝද රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ත්‍රිරෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා මේ වනවිට විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(iii) ත්‍රිරෝද රථ රියදුරන් හඳුනාගැනීම සඳහා හැඳුනුම්පතක් හා නිල ඇඳුමක් හඳුන්වාදීමටත්, ත්‍රිරෝද රථයට මීටරයක් සවි කිරීමටත් යෝජනා කර තිබේද;

(iv) එසේ නම්, ඉහත යෝජනා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

43/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතය වටා පිහිටි රක්ෂිත වනාන්තර 13ක් සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කර එම වන රක්ෂිතයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 30,000ක් දක්වා ඉහල නැංවීමට අදාළ ගැසට් නිවේදනයකට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 වර්ෂයේදී අත්සන් තබා ඇති බවත්;

(ii) එහෙත්, එම ගැසට් නිවේදනය මේ වනතෙක් ප්‍රකාශයට පත් කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් නිවේදනය අනුව සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කිරීමට යෝජිතව තිබූ එක් එක් රක්ෂිත වනාන්තරය සහ ඒවායේ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) එම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වීමට බලපාන ලද හේතු කවරේද;

(iii) ඉහත සඳහන් ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2077/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රීයව පැවැති ගිණුම් සංඛ්‍යාව සහ එම ගිණුම් සඳහා ගෙවන ලද පොළී අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පොළී අනුපාත තීරණය කිරීමේ දී සලකා බලන ලද නිර්ණායක කවරේද;

(iii) මේ වනවිට පවතින උද්ධමනය අනුව ඉහත පොළී අනුපාත ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2085/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වයඹ පළාතේ —

(i) පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ගම්මාන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ නම, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2143/2024

ගරු උදය ගම්මන්පිල මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දහම් පාසල් අවසන් විභාගය සහ ධර්මාචාර්ය විභාගය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව යටතේ ශ්‍රේණිගත කර තිබේද;

(ii) එසේ නම් , එම ශ්‍රේණිගත කිරීම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජූලි 11 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

309/2024

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රටේ සුභසිද්ධිය වෙනුවෙන් ජාත්‍යන්තර සම්බන්ධතා සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා 2020.08.20 සිට අද දක්වා නවවැනි පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහභාගී වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය සඳහා සහභාගී වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් හා නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විදේශ සංචාරවලින් අත්පත් කර ගනු ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

359/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2021 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සිදු වූ —

(i) රිය අනතුරු සංඛ්‍යාව;

(ii) මාරක රිය අනතුරු සංඛ්‍යාව;

(iii) රිය අනතුරුවලින් මරණයට පත් වූ, පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ, බරපතළ තුවාල ලැබූ සහ සාමාන්‍ය තුවාල ලබා රෝහල් ගතවූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) රිය අනතුරුවලට ලක් වූ වාහන සංඛ්‍යාව;

(v) රිය අනතුරුවලට ලක් වූ වාහන අතරින් නැවත භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වූ වාහන සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රිය අනතුරු හේතුවෙන් රජයට වාර්ෂිකව වැය කිරීමට සිදු වී ඇති අතිරේක වැය බර ගණනය කර තිබේද;

(ii) එසේ නම්, එම වාර්ෂික අතිරේක වැය බර, සෞඛ්‍ය, මහාමාර්ග සහ ප්‍රවාහන යන එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

369/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින බෞද්ධ සිද්ධස්ථාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් විහාරස්ථාන සංඛ්‍යාව;

(iii) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති බෞද්ධ භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව;

(iv) බෞද්ධ භික්ෂූන්වහන්සේලා නොමැති වීම හේතුවෙන් මේ වනවිට වැසී ගිය විහාරස්ථාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම සහ සංවර්ධනය කිරීම සඳහා ‘සසුන් උදාව’ නම් ජාතික වැඩසටහන මේ වනවිට ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එම වැඩසටහන ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

374/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිලධාරින් හා සේවකයන් සේවයට පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ඇඟිලි සලකුණු පද්ධතියක් තිබේද;

(ii) සේවයට පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු පද්ධතිය භාවිතා නොකරන නිලධාරින් හා සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2022 වර්ෂයේදී පැමිණීම හා පිටවීම සටහන් නොකර අතිකාල දීමනා ලබා ගෙන ඇති නිලධාරින් හා සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නිලධාරින් හා සේවකයන් ලබා ගෙන ඇති මුළු අතිකාල දීමනාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රේගුවේ වංචනික ලෙස අතිකාල දීමනා ලබා ගැනීම වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පියවර ගැනීම හේතුවෙන් මේ වනවිට අනාවරණය වී ඇති වංචා සංඛ්‍යාව කොපමණද;

(iii) එම වංචාවලට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

.

381/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂය වනවිට ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(ii) එම යෝජනා ක්‍රමය වෙත මුදල් ලැබෙන ආකාරය කවරේද;

(iii) එහි ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ හිමිකම් ලබා ගත හැකි වයස් සීමාව කවරේද;

(iv) එම යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඔවුන්ට වාර්ෂිකව ලබා දෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ හිමිකම් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති එහෙත් මේ වනවිට ප්‍රතිලාභ හිමිකම් නොලබන සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ප්‍රතිලාභ හිමිකම් ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඔවුන්ට ගෙවීමට ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත යෝජනා ක්‍රමය මේ වනවිට අකර්මණ්‍ය වී තිබේද;

(ii) එය සක්‍රීයව පවත්වාගෙන යාම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

467/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට කසළ ප්ලාස්ටික් ආනයනය තහනම් කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(ii) වර්ෂ 2018 සිට මේ දක්වා ආනයනය කරන ලද කසළ ප්ලාස්ටික් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මධ්‍යම පරිසර අධිකාරිය විසින් කසළ ප්ලාස්ටික් ආනයනය කිරීමට අවසර ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) කසළ ප්ලාස්ටික් ආනයනය තහනම් කිරීමට තීරණය කර තිබියදී, මධ්‍යම පරිසර අධිකාරිය විසින් කසළ ප්ලාස්ටික් ආනයනය කිරීම සඳහා ආයතන කිහිපයකට අවසර ලබා දීමට තීරණය කිරීම සඳහා පදනම් වූ කරුණු කවරේද;

(vi) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

512/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර පදවිය, බෝගස් හන්දිය ප්‍රදේශයේ, ගාමිණී විද්‍යාලයේ මේ වනවිට උග්‍ර ගුරු හිඟයක් පවතින බවත්;

(ii) මෙම ගුරු හිඟය සම්බන්ධව එම විද්‍යාලයේ ශිෂ්‍යයින් හා ඔවුන්ගේ දෙමාපියන් විසින් දැවැන්ත උද්ඝෝෂණයක් සිදු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගුරු හිඟය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

543/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව, සේවය කරනු ලබන අධ්‍යයන සහ අනධ්‍යයන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම පාසල්වල විෂය නිර්දේශ සහ විෂය බාහිර ක්‍රියාකාරකම් නියාමනය කරන්නේද;

(iv) එම පාසල්වල ශිෂ්‍ය ක්‍රියාකාරකම් හා සුවතාවයන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

566/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම්වල මේ වනවිට වගා කර ඇති වැවිලි බෝග වර්ග කවරේද;

(ii) එම බෝග ඇසුරෙන් කරනු ලබන නිෂ්පාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මණ්ඩලය සතු ඉඩම්වල ඇති, වාණිජ වටිනාකමක් සහිත දැව ලබා ගත හැකි ශාක සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග කවරේද;

(iii) එම ශාක පෞද්ගලික අංශයට අලෙවි කරන්නේද;

(iv) එසේ නම්, අලෙවි කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1242/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පිහිටුවා ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පොලිස් ස්ථානවලට හා වෙනත් රාජකාරිවලට යොදවා ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකා පොලිස් සේවයේ පුරප්පාඩු පවතී නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ආරක්ෂාව සඳහා යොදවා ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැර වෙනත් පුද්ගලයන්ගේ හෝ ආයතනවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් යොදවා තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් පුද්ගලයා/ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 ජූලි 12 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

592/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාම වැටුප් ලබා ගත් හා මේ වනවිට විශ්‍රාම වැටුප් ලබා ගනිමින් සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව හා එම එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ විශ්‍රාම වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මන්ත්‍රීවරුන් අතරින් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ලද මන්ත්‍රීවරුන් සංඛ්‍යාව, එම එක් එක් මන්ත්‍රීවරයාගේ විශ්‍රාම වැටුප හා සේවා කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විශ්‍රාම වැටුප් හිමිකම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සම්පූර්ණ කළ යුතු සේවා කාලය කොපමණද;

(iv) වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමි විශ්‍රාම වැටුප කොපමණද;

(v) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ විශ්‍රාම වැටුප, සේවා කාලය අනුව වෙනස් වන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

614/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දෙන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එලෙස ලියාපදිංචි කර නොමැති ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම ආයතන සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර ඇති සහ නොමැති ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ලබා දී ඇති ණය සංඛ්‍යාව හා එම ආයතනවල පොලී ප්‍රතිශත වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් ණය ගෙවීම ආරම්භ කිරීම සඳහා සහන කාලයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සහන කාලය කොපමණද;

(iii) ණය නිසි පරිදි නොගෙවන පුද්ගලයන්ට ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල නිලධාරින් විසින් ශාරීරික හා මානසික හිංසා සිදුකරන බව දන්නේද;

(iv) එසේ නම්, එම ආයතනවලට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(v) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කළ යුතු බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම නියාමන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

638/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු කිරි අවශ්‍යතාවය කොපමණද;

(ii) එම කිරි අවශ්‍යතාවයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(iii) 2023 වර්ෂයේදී කිරිපිටි ආනයනය කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු බිත්තර නිෂ්පාදනය කොපමණද;

(ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය උච්ඡාවචනය වී ඇති ආකාරය කෙසේද;

(iii) මේ වනවිට බිත්තරයක නිෂ්පාදන වියදම කොපමණද;

(iv) නිෂ්පාදන වියදම අඩු කර, බිත්තර මිල අඩු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1093/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමුපකාර සමිති මඟින් සපයනු ලබන සේවාවන් කවරේද;

(iv) එම සමිති මඟින් පාලනය වන ප්‍රාදේශීය අලෙවිසල් සංඛ්‍යාව කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1128/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට ඒවායේ ගබඩාකර ඇති වී ප්‍රමාණය කොපමණද;

(iv) නව වී ගබඩා ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, කවර ප්‍රදේශවලද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ වී ගබඩා වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබේද;

(ii) එසේ නම්, එම කාර්යයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1155/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ඉඩම් අහිමි, අඩු ආදායම්ලාභීන් මේ වනවිට හඳුනාගෙන තිබේද;

(ii) ඔවුන්ට ඉඩම් ලබා දීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1247/2024

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) යෝජිත ඒකාබද්ධ කම්කරු නීති ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ ප්‍රගතිය කවරේද;

(ii) එහි යම් කිසි ප්‍රගතියක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් නව නීති ගැසට් පත්‍රයේ පළකරන දිනය සහ එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එහි යම් කිසි ප්‍රගතියක් නොමැති නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය අඩුවීම සම්බන්ධයෙන් විමර්ශනය සඳහා මෙම යෝජිත කම්කරු නීති ප්‍රතිසංස්කරණවල ප්‍රතිපාදන සලසා තිබේද;

(ii) එසේ නම්, එම අදාළ ප්‍රතිපාදන කවරේද;

(iii) නො එසේ නම්, ඒවා බැහැර කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) යෝජිත ප්‍රතිසංස්කරණවල තිබෙන නම්‍යශීලී සහ අර්ධ කාලීන වැඩ සඳහා වන ප්‍රතිපාදන කවරේද;

(ii) කාන්තා ශ්‍රමිකයින් අතර අවිධිමත් අංශයේ රැකියාවලට යොමුවීම වර්ධනය වීමේ බලපෑම අවධානයට ගෙන තිබේද;

(iii) නො එසේ නම්, කාන්තා ශ්‍රමිකයින් පිළිබඳ ගැටලු විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේනම් ඒ මන්ද?

1253/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද ;

(ii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම කාර්යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම ක්‍රියාවලියේ ස්වාධීනත්වයට බලපෑම් එල්ල වන බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) මේ වනවිට දූෂිත ආයතනයක් බවට පත් වී ඇති ඉහත ආයතනය, එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1282/2024

ගරු අසංක නවරත්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සතුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් බෝග වගාවන්ට වාර්ෂිකව සිදු වන හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) එම හානි අවම කර ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1287/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම අරමුදල මඟින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අරමුදලට මුදල් ලැබෙන මාර්ග කවරේද;

(v) එම අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන

ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.3/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් එළිදැක්වීම,— මානව පරිණාමයේ සිට පුරාවිද්‍යාව, සාහිත්‍යය, ජනශ්‍රැතිය, රෝම, ග්‍රීක හා පර්සියානු ඉතිහාසය අධ්‍යයනය කොට ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රවීණ කර්තෘ මණ්ඩලයක් යටතේ රාජ්‍ය අනුග්‍රහයෙන් එළිදැක්වීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10/2024

ගරු හේෂා විතානගේ මහතා,— ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාවය,— කවර රටක කවර ක්ෂේත්‍රයක වුව ද අන්තවාදී අදහස් තිබීම ඉතා හානිකර වන හෙයින් ද, ආගමික අන්තවාදය පිළිබඳව පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පසුව සමාජයේ විශාල කථිකාවතක් ඇති වී තිබෙන හෙයින් ද, ආගමික අන්තවාදය මතුවීම හා ප්‍රවර්ධනය කිරීම වැළැක්වීම සහ එයට දැනටමත් ගොදුරු වී සිටින පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/2024

ගරු හේෂා විතානගේ මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින් රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛන්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/2024

ගරු හේෂා විතානගේ මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සළකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, හම්බනේතාට සහ බදුල්ල ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2024

ගරු හේෂා විතානගේ මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු හේෂා විතානගේ මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2024

ගරු හේෂා විතානගේ මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු හේෂා විතානගේ මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු හේෂා විතානගේ මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය (Z- Score) මත සියලුම රාජ්‍ය අංශයේ රැකියා පුරප්පාඩු පිරවීම,— රාජ්‍ය සේවයට බඳවාගැනීමේ දී පැවති හා පවත්නා ආණ්ඩු විසින් දේශපාලන පක්ෂපාතීත්වය මත හෝ රුචි අරුචිකම් මත අනුගමනය කරන ලද ප්‍රතිපත්ති රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට බරපතල හානියක් සිදු කර ඇති හෙයින් ද, ඒ හේතුවෙන් දැඩි දේශපාලනීකරණයට ගොදුරු වී ඇති රාජ්‍ය සේවය මුළුමනින්ම ස්වාධීන කර ගැනීමට අවශ්‍ය වන හෙයින් ද, අධ්‍යාපන සුදුසුකම් මත පමණක් රැකියා ලබා දීමේදී දක්ෂ හා සුදුසුකම් සහිත දරුවන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටුවන බැවින් තරුණ අසහනය මුලිනුපුටා දැමීමට ඉන් හැකිවන හෙයින් ද, දිස්ත්‍රික්කය තුළ ඇතිවන පුරප්පාඩු අදාළ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට හිමිවීම හරහා රැකියාලාභීන්ගේ ආර්ථික සුරක්ෂිතතාව මෙන්ම ඉහළ කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය අංශයට ලබා ගැනීමට අවකාශ උදාවන හෙයින් ද, සියලුම රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල සහ පළාත් සභා අනුබද්ධ සියලු ආයතනයන් හි රැකියා පුරප්පාඩු පිරවීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය සැලකිල්ලට ගැනීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 'බ්‍රේල්' ක්‍රමයට හා 'ශ්‍රවණ' (Audio) ආකාරයට සකස් කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඕනෑම රටක මූලික නීතිය හා රාජ්‍යයේ මූලික ආකෘතිය වන හෙයින් ද, මිලියන විසිදෙකකට ආසන්න වූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් ආබාධ සහිත ප්‍රජාව වන හෙයින් ද, ආබාධ ප්‍රජාව අතරින් ද ලක්ෂ හයකට ආසන්න ප්‍රමාණයක් ශ්‍රවණාබාධ සහ දෘශ්‍යාබාධ සහිත පුරවැසියන් වන හෙයින් ද, රටේ මූලික නීතිය පිළිබඳ දැනීමක් හා අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම ශ්‍රවණ සහ දෘශ්‍යාබාධ සහිත ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 'බ්‍රේල්' ක්‍රමයට හා 'ශ්‍රවණ' (Audio) ආකාරයට සකස් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— 50% බැගින් ජාතික කුසලතාවට අදාළව සහ පාසැල් පදනමට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසු සිසුවියන් තෝරා ගැනීමේ දර්ශකය වන Z-අගය (Z- Score) ගණනය කිරීම,— අ.පො.ස. උසස් පෙළ සමත් සිසු සිසුවියන් අතරින් කලා පීඨ හැර අනෙකුත් විශ්වවිද්‍යාල පීඨ සඳහා සිසුන් බඳවා ගැනීමේ පදනම හා දර්ශකය Z-අගය මත සකස් කර ඇති හෙයින් ද, මෙම ක්‍රමවේදයට අනුව Z-අගයෙන් 40% ක් ජාතික කුසලතාව (national Merits) මත පදනම්ව ද 55% ක් දිස්ත්‍රික් පදනම (district basis) මත පදනම්ව ද 5% ක් අති දුෂ්කර දිස්ත්‍රික්ක (remote districts) මත පදනම්ව ගණනය කරනු ලබන හෙයින් ද, ඕනෑම දිස්ත්‍රික්කයක ඇති සියලුම පාසැල් සඳහා සමාන ලකුණු මට්ටමක් හෝ අගයක් ආදේශ කිරීම යුක්ති

සහගත හෝ සාධාරණ නොවන හෙයින් ද, දිස්ත්‍රික්ක හා අති දුෂ්කර දිස්ත්‍රික්ක පදනම වෙනුවට පාසැල් පදනම වශයෙන් ආදේශ කොට පාසැල් පද්ධතිය තුළ ඇති උසස් පෙළ විෂය ධාරාවන් සහිත පාසැල් තුන්දහස් හතළිස් දෙක (3042) කාණ්ඩ කිහිපයකට වර්ගීකරණය කොට විශ්වවිද්‍යාල ජාතික කුසලතාවට අනුව 50% ක් ද පාසැල් පදනමට අදාළව 50% ක් ද වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා Z-අගය ගණනය කිරීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීම,— ශ්‍රී ලාංකික සිංහල සමාජයේ පුද්ගල නාමකරණයේ දී වාසගම බොහෝවිට යෙදී ඇත්තේ වැඩවසම් සමාජය තුළ තිබූ රාජකාරි සහ රාජ මෙහෙවරට පසුබිම්ව වන හෙයින් ද, ඇතැම් වාසගම් යෙදී ඇත්තේ මෙම රාජකාරිවලට අදාළ කුලය ඉස්මතු වන හෙයින් ද, අධිකරණ කටයුත්තකට හෝ මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද දායකයා කැඳවන විටදී හෝ විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයක දී උපාධි අපේක්ෂකයා කැඳවන විට දී හෝ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගම ශබ්ද නගා ප්‍රකාශ කිරීම හේතුවෙන් බොහෝ පුද්ගලයන් දැඩි අපහසුතාවයට පත්වන හෙයින් ද, වර්තමාන පරම්පරාව විසින් ප්‍රතික්ෂේප කරන නූතන ලෝකයට ආදේශ කළ නොහැකි මෙම නීතිය, සිරිත හෝ සම්ප්‍රදාය ඉවත් කොට ජනතාව ඉදිරියේ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා 2023 වර්ෂය වනවිට පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යාපීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් 2020 පෙබරවාරි 13 දින මවිසින් ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට ලබා දීම,— ශ්‍රී ලංකාවේ අවසන් වරට පවත්වනු ලැබූ ජන සංගණනයට අනුව මෙරට ආබාධ සහිත ප්‍රජාව මුළු ජනගහනයෙන් 8% ඉක්මවා ගොස් ඇති හෙයින් ද, ග්‍රාමීය පරිපාලනය සිදුවන පළාත් පාලනයේ සිට ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන පාර්ලිමේන්තුව දක්වා මහජන නියෝජිත ආයතනවලට ආබාධ සහිත ප්‍රජාව තේරී පත්වීමට අල්ප අවකාශයක් හිමි ව ඇති හෙයින් ද, ආබාධ සහිත

මෙරට පුරවැසියන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සිදුව ඇත්තේ ද සිදුවන්නේ ද දියුණු රටවල සංකල්පවලට අනුව නොවන හෙයින් ද, සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ නාම යෝජනා සැකසීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට හිමිවන සේ රජය විසින් අදාළ පනත් හා නීති සංශෝධනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන හෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම,— 1980 දශකයේ දී ආරම්භ කරන ලද නිල්වලා ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ හා නිල්වලා නිම්නයේ ජීවත්වන ජනතාවගේ දෛනික ජීවිතය හා ආර්ථිකය බරපතල අර්බුදයකට පත්වී ඇති හෙයින් ද, ඌරුබොකු ඔය සහ කිරම ආර හම්බන්තොට ශුෂ්ක කලාපයට හැරවීම, පහළ නිම්නයේ බටුවිට ජලාශය, අතුරලිය ජලාශය, කඩවැද්දුව ජලාශය සහ දෙදියගල ජලාශය නිර්මාණය කිරීම සහ ආරක්ෂිත කලාපය හා අනාරක්ෂිත කලාප පිළිබඳ නැවත අධ්‍යයනය කොට අත්හරින ලද වේලි (bunts) නැවත ඉදිකිරීම ප්‍රමුඛ කොටගත් මාතර හා හම්බන්තොට ප්‍රදේශවලට සෘජුවම බලපාන නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතියේ මූලික සැලසුම් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2024

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2024

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2024

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2024

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2024

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම,— කඳුරට වතුකර කම්කරුවන් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ එහි ආර්ථිකය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබාදුන් ප්‍රජාවක් වන හෙයින් ද, ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ තම අයිතිවාසිකම් දිනා ගනිමින් එම අරගලයන් හි දී සිය ජීවිත පූජා කළ වෘත්තීය සමිති විරුවන් එක් පොදු දිනක දී සිහිපත් කිරීම මෙරට ජීවත්වන ඉන්දීය සම්භවයක් සහිත කඳුරට ජනතාවගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වන හෙයින් ද, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා සිදු කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගලයේ දී සුදු ජාතිකයෙකු විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් “මුල්ලෝයා ගෝවින්දන්” නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ හෙයින් ද, කඳුරට කම්කරු ප්‍රජාව විසින් සිදුකරන ලද අවිහිංසාවාදී අරගලයේ දී ජීවිතය පූජා කළ එම පළමු කම්කරුවා සහ ඉන් අනතුරුව කඳුරට කම්කරු ජනතා අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා දියත් කෙරුණු බොහෝ වෘත්තීය සමිති අරගලයන් හි දී ජීවිත පූජා කළ අනෙකුත් විරුවන් සැමරීම සඳහා එම පළමු වෘත්තීය සමිති විරුවා මියගිය දිනය වන ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2024

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— 1798 වර්ෂයේදී ආරම්භ කරන ලදුව 1882 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් විධිමත් කරන ලද වසර දෙසීයකට අධික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකා තැපැල් සේවය අප රට තුළ නිදහසින් පසුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන රජය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවක් වන හෙයින් ද, කඳුරට වතුකර ජනතාව මෙරට පදිංචි වී වසර දෙසීයක පමණ කාලයක් ගත වී ඇතත් ඔවුන් පදිංචි නිවාස වෙත සෘජුව ලිපි රැගෙන ගොස් භාර දීමක් සිදු නොවන හෙයින් එම ජනතාව විවිධ අපහසුතාවන්ට පත් වී සිටින හෙයින් ද, අවුරුදු දෙසීයක කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන මෙම ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2024

ගරු රෝහණ බංඩාර මහතා,— ඩිජිටල් අධ්‍යාපන ක්‍රමයට අවශ්‍ය මූලික පදනම සකස් කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ලෝකය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන පසුබිමක පවතින හෙයින් ඊට අනුරූපව අධ්‍යාපන ක්‍රමය ද වෙනස් විය යුතු හෙයින් ශ්‍රී ලංකාව තුළ ද ඩිජිටල් අධ්‍යාපන ක්‍රමය සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලමේන්තුව යෝජනා කරයි.

පා.40/2024

ගරු රෝහණ බංඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන සහ නීති අංශ ශක්තිමත් කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ඇතුළු ක්‍රීඩා සංගම් රැසක් අතිශය දූෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් එම තත්ත්වය මැඩපැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා නීති අංශ ශක්තිමත් කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමූපකාර ග්‍රාමීය බැංකුවල තැන්පත්කරුවන්ගේ තැන්පතු ආරක්ෂා කිරීම,— සමූපකාර ව්‍යාපාරයට සම්බන්ධ ග්‍රාමීය සමූපකාර බැංකු කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ විශ්වාසය ඉහළ මට්ටමක පැවතිය ද විවිධ ගැටලු හේතුවෙන් දෙහිවල-ගල්කිස්ස සමූපකාර ග්‍රාමීය බැංකුව, මහරගම සමූපකාර ග්‍රාමීය බැංකුව වැනි ග්‍රාමීය බැංකු මේ වනවිට බිඳ වැටී ඇති හෙයින් ඉතා අසීරු තත්ත්වයකට පත් වී ඇති එහි තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා සුදුසු වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඵලදායීව ආයෝජනය කිරීම,— පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සුබසාධනය උදෙසා පිහිටුවා ඇති සේවක අර්ථසාධක අරමුදල සතු මුදල්, කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තු ගත නොකළ සමාගම්වල ආයෝජනය කිරීම තුළින් කිසිදු ප්‍රතිලාභයක් අත් වී නොමැති බවට ජාතික විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති හෙයින්, පෞද්ගලික අංශයේ සේවකයන්ට වැඩි ප්‍රතිලාභ අත්වන පරිදි එම අරමුදල් ඵලදායී ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/2024

ගරු රෝහණ බංඩාර මහතා,— දුම්රිය දෙපාර්තමේන්තුව තුළ කාලීන වෙනස්කම්වලට ඔරොත්තු දිය හැකි ආයතන ව්‍යුහයක් සකස් කිරීම,— සීඝ්‍රයෙන් තාක්ෂණය වෙනස් වෙමින් පවතින ලෝකයේ, අධිරාජ්‍යවාදීන්ගේ සමයේ හඳුන්වා දුන් දෙපාර්තමේන්තු රාමුව යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව තවදුරටත් පවත්වාගෙන යා නොහැකි හෙයින්, එම දෙපාර්තමේන්තුව තුළ කාලීන වෙනස්කම්වලට ඔරොත්තු දිය හැකි ආයතන ව්‍යුහයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම,— ලිවීමට සහ කියවීමට ඇති හැකියාව හෙවත් සාක්ෂරතාවය ශ්‍රී ලංකාවේ ඉහළ අගයක පැවතුන ද, මූල්‍ය සාක්ෂරතාවය තවමත් පහළ අගයක පවතින හෙයින්, පාසල් අවධියේ සිටම මූල්‍ය සාක්ෂරතාවය ජනගත කිරීම සඳහා සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2024

ගරු රොෂාන් රණසිංහ මහතා,— ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාවට සිය අනාගතය සාර්ථක කරගැනීම සඳහා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන විධිමත් අයුරින් ලබාදීම,— ශ්‍රී ලංකාවේ අ.පො.ස. (සා. පෙළ) සහ අ.පො.ස. (උ. පෙළ) විභාග සඳහා ලක්ෂ සංඛ්‍යාත සිසු පිරිසක් වාර්ෂිකව පෙනී සිටින හෙයින් ද, මෙම විභාගවලින් සමත්වන සහ අසමත්වන සිසු පරපුරේ අනාගතය සකස්කර ගත යුතු ආකාරය පිළිබඳ සිසුන් බහුතරයකට හා ඔවුන්ගේ දෙමව්පියන්ට නිසි අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය වී ඇති හෙයින් ද, නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශනයක් ලබාදීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතන මඟින් සිය යුතුකම් හා වගකීම් නිසි අයුරින් ඉටු නොකරන බව පෙනී යන හෙයින් ද, ශ්‍රී ලංකාවේ පවතින විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්වාගෙන යන උපාධි පාඨමාලා, කාර්මික හා තාක්ෂණ විද්‍යාල හා ඒවායේ පාඨමාලා, පිළිගත් පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳ අවබෝධය, ලෝකයේ පිළිගත් විදේශීය විශ්වවිද්‍යාල පිළිබඳ අවබෝධය සහ දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ලබාගැනීමේ ක්‍රමවේද පිළිබඳ අවබෝධය විධිමත් අයුරින් ලබාදීම සඳහා ශිෂ්‍ය ප්‍රජාව දැනුම්වත් කිරීමට නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශනයක් ලබාදීම පිණිස රජය විසින් ස්ථිරසාර ජාතික වැඩපිළිවෙළක් ස්ථාපනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/2024

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— දේශපාලන පක්ෂවල නිලධාරි මණ්ඩල තුළ කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීම,— දේශපාලනය තුළ කාන්තා සහභාගිත්වය සහ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය ඉහළ දැමීමේ සාකල්‍ය ප්‍රවේශයක් ලෙස සෑම ලියාපදිංචි දේශපාලන පක්ෂයක් විසින්ම ස්වකීය විධායක කාරක සභාවේ තීරණ ගැනීමේ මට්ටම/ ධාරිතාව තුළ අවම වශයෙන් 30%ක් කාන්තාවන් පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.